## 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත

## 14 වැනි වගන්තිය යටතේ නියෝග

වෙළඳ අමාත්‍ය බන්දුල ගුණවර්ධන වන මම, මුදල් අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2020 නොවැම්බර් මස 18 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, මෙහි උපලේඛනයේ III වැනි තීරුවේ දක්වා ඇති භාණ්ඩ මත ආනයනය කරන අවස්ථාවේ තීරුබදු කාර්යය සඳහා සලකන වටිනාකමට, එකී උපලේඛනයේ IV වැනි තීරුවේ ඒ සඳහා දක්වා ඇති අදාල අනුපාතයන් පරිදි, සෙස් බද්දක් නියම කොට අය කර ගත යුතු බව මෙම නියෝගය මගින් ප්‍රකාශයට පත් කරමි. එසේ වුවද;

මෙම උපලේඛනයේ IV වැනි තීරුවේ එකකට වඩා වූ බදු අනුපාතිකයන් දක්වා ඇති විට, ගෙවිය යුතු සෙස් බද්ද ගණනය කිරීමේදී අදාළ වන අනුපාතය වනුයේ, සෙස් බද්ද වශයෙන් වැඩි මුදලක් ගෙවිය යුතු වන අනුපාතයයි.

මෙම නියෝගයෙහිම අදාල කොටසක් වන **ඇමුණුම - ඒ** හි සඳහන් භාණ්ඩ ආනයනය කරනු ලබන අවස්ථාවන්හිදී මෙම නියෝගය මගින් පනවනු ලබන සෙස් බද්ද අදාළ නොවේ.

1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ පනවන ලදුව, 2017.11.27 දිනැති අංක 2047/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත නියෝගය ද, එකී වගන්තිය යටතේ ආනයනය සම්බන්ධයෙන් පනවන ලද වෙනත් නියෝගද, මෙමගින් අවලංගු කරමි.

අත්. කලේ / **ආචාර්ය බන්දුල ගුණවර්ධන**
**වෙළඳ අමාත්‍ය**

2020 නොවැම්බර් මස ...17..... වැනි දින
කොළඹ 02.
වෙළඳ අමාත්‍යාංශය